චක්‍රලේඛ අංක:- 06/2002

(19)

මගේ අංකය:- එම්/1/42,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
ආර්.ඒ.ද.මැල් මාවත,
කොළඹ 03.

2002.06. 10

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක රෙජිස්ට්‍රාර්
ජනරාල් වරුන්/ප්‍රාදේශීය ලේකම් වරුන්/
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වරුන් හා ඉඩම් හා
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ
පරිපාටිය 18(ආ) වගන්තිය සංශෝධනය කිරීම

උක්ත කරුණට අදාල මගේ අංක.එම් 19 හා 1998.10.15 දින දරන ලිපියට ඔබගේ අවධානය මෙයින් යොමු කරවමි.

02. ඉහත සඳහන් ලිපියට 'අ' උපලේඛණය වශයෙන් යාකර තිබූ විවාහ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ පරිපාටිය මෙහි පහත දැක්වෙන අන්දමට සංශෝධනය කරන ලදී. ඒ බව කරුණාකර සටහන්කර ගන්න.

| පරිපාටියේ වගන්තිය | කලින් පැවති පිළිවෙල | සංශෝධනය අනුව |
| --- | --- | --- |
| 18'ආ' සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය | දිස්ත්‍රික් ලේකම්(දිසාපති) හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම්(අතිරේක දිසාපති) සභාපති වශයෙන්ද, කලාපයේ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් සහ දිස්ත්‍රික්කයේ සේවය කරන වෙනත් දෙපාර්තමේන්තුවක මාණ්ඩලික නිළධාරියෙකුගේත්ද සමන්විත විය යුතුය. | දිස්ත්‍රික් ලේකම්(අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්) හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම් (අතිරේක දිසාපති) සභාපති වශයෙන්ද දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා සහ වෙනත් දෙපාර්තමේන්තුවක මාණ්ඩලික නිලධාරියෙකු ගෙන්ද සමන්විත විය යුතුය. |

03. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සංශෝධනය වහාම ක්‍රියාත්මක වේ.

එල්.කේ. රත්නසිරි
රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:- 1. ලේකම්, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - යොමු අංක. ඒඩී/බීආර්/පොදු/VII. හා 2002.5.17 දින ලිපිය අනුව දැනගැනීම සඳහා
2. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිළධාරීන්ගේ දැනගැනීම සඳහා
3. මධ්‍යම ලේඛණාගාරයේ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් - දැනගැනීම සඳහා.